# 1994 අංක 09 දරන සබරගමුව පළාතේ මුද්දර ගාස්තු හැරවීම (සංශෝධන) ප්‍රඥප්තිය

Stamp Duty Transfer (Ammendment)

සබරගමුව පළාතේ පළාත් සභාව විසින් මෙසේ සම්මත කරනු ලැබේ

1. මේ ප්‍රඥප්තිය 1994 අංක 09 දරන සබරගමුව පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

1990 අංක 06 දරන සබරගමුව පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තියේ 2 වැනි ජේදය වෙනුවට

2. 1990 අංක 06 දරන සබරගමුව පළාතේ මුදල් ප්‍රඥප්තිය සහ 1992 අංක 03 දරන සබරගමුව පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය ප්‍රකාර, පළාත් සභාව විසින් සබරගමුව පළාතේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා, ඇතුලත පිහිටි යම් නිශ්චල හෝ චංචල දේපලක් පැවරීම සම්බන්ධයෙන් වූ යම් මුද්දර ගාස්තුවක් අයකර, එකතුකර, සබගමුව පළාතේ පළාත් සභා අරමුදල ගෙවාඅ ඇති අවස්ථාවක පළාත් සභාව එම මුද්දර ගාස්තුව අයකර එකතු කරනු ලැබුවේ යම් නිශ්චල හෝ චංචල දේපලක් පිහිටා ඇත්තේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමාවක් ඇතුලත ද, ඒ පළාත් පාලන ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධාරියා විසින් ඉහත කී පරිදි ඒ මුද්දර ගාස්තුව අයකර එකතු කරන ලද වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින සිට අවුරුදු දෙකක් වූ කාල සීමාවක් ඇතුළත, සබරගමුව පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ මුදල් පිළිබඳ විෂය භාර අමාත්‍යවරයා වෙත ලියවිල්ලකින් හිමිකමක් ඉදිරිපත් කරනු ලැබූ විට, පළාත් සභාව විසින් ඒ පළාත් පාලන ආයතනයට ඒ මුද්දර ගාස්තු මුදල් හැරවිය හැකිය.

3. මෙම ප්‍රඥප්තියෙහි සිංහල සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම්කිසි වෙනසක් වේ නම් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

සමහර බදු, බලපත්‍ර ගාස්තු හා වෙනත් ගාස්තු, අයකර ගැනීම සහ දණ්ඩනයන් පැනවීම හා එකතු කිරීම සහ ඊට ආනුෂංගික වෙනත් කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

(1) තෑගි තරංග ආඥාපනත,

(2) තුරංග තරංග ආඥාපනත,

(3) රාජ්‍ය ඉඩම් ආඥාපනත,

(4) වෛද්‍ය ආඥා පනත,

(5) ඖෂධ ආඥාපනත,

(6) පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනත,

(7) පඩි හා මිමි ආඥාපනත,

''පළාත් පාලන ආයතනය'' යන්නෙන් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතල වලට, කාර්ය වලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ,
''පළාත'' යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමු පළාත අදහස් වේ,

''පළාත් සභාව'' යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාව අදහස් වේ,

5. මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

3. මෙම වගන්තිය යටතේ වූ ඔට්ටු බද්ද ඔට්ටුවක් තැබූ විගසින්ම අයවිය යුතු වන අතර, එවැන ඔට්ටු බද්දක් ගෙවීමට යටත් වන යම් තැනැත්තෙක් එක් එක් ලිත් මාසය සඳහා ගෙවිය යුතු ඔට්ටු බදුවල එෛක්‍යය, එකී ලිත් මාසය ගෙවී දින දහසක් ඇතුළත පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවිය යුතුය.

4. ඔට්ටු බද්දක් ගෙවීමට යටත් වන යම් තැනැත්තෙක් (3) වැනි උප වගන්තියෙහි විශේෂිතව දක්වා ඇති පරිදි නියමිත දින දී හෝ ඊට පෙර එම බද්ද ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක, එම තැනැත්තා පැහැර හරින්නෙක් ලෙස සැළකිය යුතුය.

5. යම් ඔට්ටු බද්දක් ගෙවීම පැහැර හැර ඇති විට, පැහැර හරින්නා විසින්

ගෙවීම් පැහැර හැර ඇති මුදලෙන් සියයට දහයකට සමාන මුදලක්ද, ඉන්පසුව එළඹෙන සෑම මාසයක් සඳහාම සියයට පනහක උපරිමයක් දක්වා සියයට දෙකක අමතර මුදලක්ද, දණ්ඩන වශයෙන් ගෙවිය යුතුය.

6. (5) වැනි උප වගන්තියෙහි සඳහන් කළ දණ්ඩයන්ද ඇතුළුව යම් ඔට්ටු බදු මුදලක් ගෙවීම පැහැර හැර ඇති විට, එය පළාත් සභාවට අයවිය යුතු ණයක් ලෙස සලකා පැහැර හරින්නාගෙන් අයකර ගත හැකිය.

## III වැනි පරිච්ඡේදය
## ඉඩම් හා ගොඩනැගිලි බද්ද

7. (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබෙන නියමයක් මගින් එකී නියමයෙහි සඳහන් කරනු ලබන අනුප්‍රමාණයන්ට අනුව හා පාර්ලිමේන්තුව විසින් පනවා ඇතිව නීතිවලින් අවසර ඇති ප්‍රමාණයට පළාත ඇතුළත පිහිටි යම් ඉඩම් හෝ ගොඩනැගිල්ලක් වෙනුවෙන් පවත්නා ප්‍රාග්ධන අගය අනුව බද්දක් පැනවීම හා අයකර ගැනීම කළ හැකිය

(1) වැනි උප වගන්තියෙහි ''ඉඩම'' යන්නට රජයට අයිති යම් ඉඩමක්ද, ''ගොඩනැගිල්ල'' යන්නට රජයට අයිති යම් ගොඩනැගිල්ලක්ද ඇතුළත් වේ.

(2) (1) වැනි උප වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ මාසයක් ඇතුළත පළාත් සභාවේ අනුමැතිය සඳහා එයට ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියමයක් අනුමත දිනයේ සිට, පරිච්ඡින්න කරන ලද ලෙස සළකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගුභාවයට ඉන් හානියක් නොවිය යුතුය.

(3) මෙම වගන්තියෙහි කාර්ය සඳහා 'ප්‍රාග්ධන අගය' යන්නෙන් යම් ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් වන විට, එකී ගොඩනැගිල්ලට කරන ලද හෝ සවි කරන ලද වැඩිදියුණු කිරීම්, එකතු කිරීම්, සවි කිරීම් හා යම් කරන ලද ද්‍රව්‍ය ද එකී ගොඩනැගිල්ල පිහිටා තිබෙන ඉඩමේ මිළ ද

ඇතුළුව එකී ගොඩනැගිල්ල ඉදිකිරීමට වැය වූ වියදමද, යම් හිස් ඉඩමක් සම්බන්ධයෙන් වන විට, පසුගිය වර්ෂයෙහි දෙසැම්බර් මස 31 වැනි දිනය එකී ඉඩමෙහි වෙළඳ අගය අදහස් වේ.

(4) මෙම පරිච්ඡේදයෙහි ඇතුළත් විධිවිධාන අමාත්‍යවරයා විසින් ඒ සඳහා නියම කරනු ලබන දිනයක දී ක්‍රියාත්මක විය යුතුය.

## IV වැනි පරිච්ඡේදය

## ඉඩම් සංවර්ධන ආඥා පනත හා රාජ්‍ය ඉඩම් ආඥාපනත යටතේ අන්සතු කරන ලද ඉඩම් සඳහා වූ ගාස්තු

8. පළාත් ඇතුළත පිහිටා ඇති යම් ඉඩමක් සඳහා ඉඩම් සංවර්ධන ආඥාපනත හෝ රාජ්‍ය ඉඩම් ආඥාපනත යටතේ ගෙවිය යුතු යම් ගාස්තුවක් පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවිය යුතුය

ඉඩම් සංවර්ධන ආඥාපනත හා රාජ්‍ය ඉඩම් ආඥා පනත යටතේ අන්සතු කරන ලද ඉඩම් සඳහා වූ ගාස්තු

## V වැනි පරිච්ඡේදය

9. සාමාන්‍යයෙන් පළාත ඇතුළත නේවාසික වූ යම් තැනැත්තෙකුගෙන් වෛද්‍ය ආඥාපනත යටතේ පනවනු ලැබූ යම් අය කිරීමක් ද ඇතුළුව ඒ යටතේ අයකර ගනු ලබන යම් ගාස්තුවක් එම ආඥා පනත යටතේ එය ලබා ගැනීමට බලය ඇති අධිකාරිය විසින් හෝ පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් එම කාර්ය සඳහා පත් කරනු ලැබූ යම් වෙනත් තැනැත්තකු විසින් අයකර ගත යුතුය. එහෙත් කවර අවස්ථාවකදී වුවද එකී ගාස්තු හා අයකිරීම් එකී කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කළ යුතුය.

වෛද්‍ය ආඥාපනත යටතේ අයකරනු ලබන ගාස්තු

10. (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියෝගයක් මගින් නියම කරනු ලබන අනුප්‍රමාණවලට අනුව ඖෂධ හා රසායන ද්‍රව්‍ය වෙළෙන්දකු ලෙස බලපත්‍රයක් ලබා ගෙන පළාත තුළ ඖෂධ හා රසායන ද්‍රව්‍ය වෙළඳ ව්‍යාපාරයක යෙදී සිටින සෑම තැනැත්තෙක් ම (මෙහි මින් මතු ''ඖෂධ හා රසායන ද්‍රව්‍ය බද්ද'' යනුවෙන් හඳුන්වන ලබන) බද්දකට යටත් විය යුතුය.

ඖෂධ හා රසායන ද්‍රව්‍ය සඳහා බලපත්‍ර බද්ද

(2) (1) වන උප වගන්තිය යටතේ ඖෂධ හා රසායන ද්‍රව්‍ය බද්දකට

යටත් වන්නා වූ සෑම තැනැත්තෙක්ම මෙම ප්‍රඥප්තිය බලාත්මක වන්නා වූ දින සිට මාසයක් ඇතුළත ඔහුට ඇති බලපත්‍රයෙහි ද පිටපතක් සහිතව ඔහුට සපයනු ලබන යම් ආකෘති පත්‍රයක ඔහුගේ ව්‍යාපාර ස්ථානය පිළිබඳ වාර්තාවක් පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් පත් කරනු ලැබිය හැකි යම් නිලධරයකුට ඉදිරිපත් කළ යුතුය.

(3) (1) වැනි උප වගන්තිය යටතේ අයකර ගත යුතු බදු අනුපාතය බලපත්‍ර ලත් වෙළෙන්දා ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යන පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකමට සමානුපාතික විය යුතුය.

(4) (1) වැනි උප වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ මාසයක් ඇතුළත පළාත් සභාවේ අනුමැතිය සඳහා එයට ඉදිරිපත් කළ යුතුය, එසේ අනුමත නොකරනු ලැබූ යම් නියමයක් අනනුමානයේ දිනයේ සිට, පරිච්ඡින්න කරන ලද ලෙස සළකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගුභාවයට ඉන් හානියක් නොවිය යුතුය.

## VI වැනි පරිච්ඡේදය

## බණිජ අයිතීන් පිළිබඳ බද්ද

11. (1) පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක හෝ අවසරපත්‍රයක බලය යටතේ පළාත ඇතුළත පිහිටි ඉඩමකින් යම් ද්‍රව්‍ය කැණීමේ, සෙවීමේ, ලබා ගැනීමේ හෝ ඉවත් කරගෙන යාමේ අයිතිවාසිකම් ලබාදී අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පල කරනු ලබන නියමයකින් නියම කරනු ලබන අනුප්‍රමාණයට හෝ අනුප්‍රමාණයන්ට අනුව වූ, (මෙහි මින් මතු ''ඛනිජ බද්ද'' යනුවෙන් හඳුන්වනු ලබන) බද්දක්, එවැනි තැනැත්තන්ට ලබා දී ඇති අයිතිය මත පළාත් සභාවේ යෝජනා සම්මතයක් මගින් පනවා අයකර ගත හැකිය. බණිජ අයිතීන් පිළිබඳ බද්ද

(2) (1) වැනි උප වගන්තිය යටතේ පනවනු ලබන ඛනිජ බද්ද බලපත්‍රයේ ලබා දී ඇති අයිතිවාසිකම්වලට හා ව්‍යාපාරය පිරිවැටුමට සමානුපාතික විය යුතුය.

(3) (1) වැනි වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ මාසයක් ඇතුළත පළාත් සභාවේ අනුමැතිය සඳහා එයට ඉදිරිපත් කළ යුතුය, එසේ අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක් අනනුමතයේ දිනයේ සිට, පරිච්ඡින්න කරන ලද ලෙස සළකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගුභාවයට ඉන් හානියක් නොවිය යුතුය.

## VII වැනි පරිච්ඡේදය

## පඩි හා මිමි ආඥාපනත යටතේ අයකරනු ලබන ගාස්තු

පඩි හා මිම ආඥාපනත යටතේ ක්‍රමවත් කිරීමේ ගාස්තු

12. පළාත් ඇතුළත පඩි හා මිමි ආඥාපනත යටතේ අයකර ගනු ලබන ක්‍රමවත් කිරීමේ ගාස්තු එම ආඥාපනත යටතේ ඒවා අයකර ගනු ලබන බලධරයා විසින් පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කළ යුතුය.

## VIII වැනි පරිච්ඡේදය

## වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ වූ ගාස්තු

වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂාණ ආඥාපනත යටතේ ගාස්තු

13. පළාත ඇතුළත වූ යම් ප්‍රදේශයක් සඳහා වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ අයකර ගනු ලබන ගාස්තු එම ආඥා පනත යටතේ එම ගාස්තු අයකර ගැනීමට අයිතියක් ඇති බලධරයා විසින් හෝ පළතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් පත් කරන ලද යම් නිලධරයකු විසින් අයකර ගත යුතුය. එහෙත් කවර අවස්ථාවක දී වුව ද එකී ගාස්තු පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කළ යුතුය.

මෙම ප්‍රඥප්තියෙහි සමහර කරුණු සම්බන්ධයෙන් 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තියෙහි විධිවිධාන අදාල විය යුතුය.

14. (1) මෙම ප්‍රඥප්තිය 1990 අංක 06 දරන සබරගමු පළාතෙහි මුදල් ප්‍රඥප්තියට අතිරේකයක් වශයෙන් සැළකිය යුතු අතර, එකී මුදල් ප්‍රඥප්තියෙහි විධිවිධාන පරිපාලනය කරන පළාතෙහ පළාත් ආදායම් කොමසාරිස්වරයා මෙම ප්‍රඥප්තියෙහි කාර්ය සඳහා ද පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා විය යුතුය. පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් මෙම ප්‍රඥප්තිය යටතේ ඔහුගේ සහායකයින්ට

පවරා දෙනු ලබන බලතලවලට අනුව ඔවුන්ට ක්‍රියා කළ හැකිය.

(2) සබරගමුව පළාතේ 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තිය යටතේ බදු සහ වෙනත් අයකර ගැනීම් තක්සේරු කිරීමටද, ඒ යටතේ අභියාචනයන්ට ද එහි සඳහන් කර ඇති වාර්තා හා දණ්ඩනයනට ද අදාල විධිවිධාන, මෙම ප්‍රඥප්තිය යටතේ ද බදු සහ වෙනත් ගාස්තු තක්සේරු කිරීම, වාර්තා හා දණ්ඩනයන්ටද අදාල විධිවිධාන, මෙම ප්‍රඥප්තිය යටතේ ද බදු සහ වෙනත් ගාස්තු තක්සේරු කිරීම, වාර්තා හා දණ්ඩන ආදිය සඳහා ද, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාල වන අතරම, එම ප්‍රඥප්ති යටතේ පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා සතු සියළුම බලතල, එකී යම් කරුණක් සම්බන්ධයෙන් මෙම ව්‍යවස්ථාවෙහි විශේෂිතව සඳහන් කර නොමැති නම්, මෙම ප්‍රඥප්තිය යටතේ ද ඔහු විසින් ක්‍රියාත්මක කළ හැකිය.

## IX වැනි පරිච්ඡේදය

## සාමාන්‍ය

15. මෙම ප්‍රඥප්තියෙහි යම් විධිවිධානයක් කඩ කරන හෝ ඒ අනුව කටයුතු කිරීමට අපොහොසත් වන ඕනෑම තැනැත්තෙක් මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරන අතර, මහේස්ත්‍රාත්වරයා ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව රුපියල් දහසකට නොවැඩි දඩයකින් හෝ තුන් මාසයකට නොවැඩි සරල බන්ධනාගාරගත කිරීමකින් හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන මේ දෙකින්ම හෝ දඬුවම් ලැබීමකට යටත් වන්නේය.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ අර්ථ නිරූපණය ප්‍රඥප්තියෙහි- අර්ථ නිරූපනය

''අමාත්‍යවරයා'' යන්නෙන් පළාතෙහි අමාත්‍ය මණ්ඩලයෙහි මුදල් විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ.

''පළාත'' යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි පළාතක් අදහස් වේ.

''පළාත් සභාව'' යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි සබරගමු පළාතෙහි පළාත් සභාව අදහස් වේ.

17. මේ පනතේ සිංහල දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලාතවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය

අනනුකූලතාවය ඇති වූ විට සිංහල භාෂා බලපැවැත්විය යුතු බව